දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2014 පරීක්ෂණය - 2017 ඔක්තෝබර්
Bachelor of Arts General (External) Degree Part II 2014 Examination – October 2017

# භූවිසා 3.2 - ප්‍රාදේශීය භූගෝල විද්‍යාව
# GYG 3.2 - Regional Geography

කාලය පැය තුන යි

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතයි. එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

## 01 වන කොටස

01. භූගෝල විද්‍යා විෂයෙහි "ප්‍රදේශ" (Regions) යන්න හඳුනා ගන්නේ කෙසේ ද? ඔබ දන්නා වර්ගීකරණයක් ඇසුරින් නිශ්චිත නිදසුන් සහිතව විමර්ශනය කරන්න.

(ලකුණු 20 යි)

02. (i) ප්‍රාදේශීය භූගෝල විද්‍යාව (Regional Geography) යනු කුමක් ද?

(ලකුණු 10 යි)

(ii) භූගෝල විද්‍යා විෂය තුළ ප්‍රාදේශීය භූගෝල විද්‍යාවේ සංවර්ධනය සහ විකාශනය සිදු ව ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

03. (i) පාරිසරික සංචරණය (Ecotourism) යනු කුමක්දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08 යි)

(ii) ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාවේ පාරිසරික සංචරණයේ ඇති විභවතාව නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 12 යි)

04. "ස්වභාවික සම්පත් භාවිතය මනා ලෙස කළමනාකරණය නොවීම ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය අඩාල කිරීමට සමත් ව ඇත." ඉහත ප්‍රකාශය නිශ්චිත නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 20 යි)

## 02 වන කොටස

05. (i) ශ්‍රී ලංකාවේ පලාත් අතර ඇති සංවර්ධන විෂමතාවයන් උචිත දත්ත පදනම් කර ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

(ii) ඉහත සංවර්ධන විෂමතාවයන් අවමකරලීමට රජය මගින් ඉදිරිපත් කර ඇති සැලසුම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08 යි)

06. (i) මානව සංවර්ධන දර්ශකය (Human Development Index) ගණනය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

(ii) මානව සංවර්ධන දර්ශකය තරා කිරීමේ දී ශ්‍රී ලංකාවේ තත්වය අනිකුත් රටවල් සමඟ සංසන්දනය කොට විග්‍රහ කරන්න.

(ලකුණු 08 යි)

07. (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක පලාත් පාලන ආයතන මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(ii) ඉහත පලාත් පාලන ආයතනවල කාර්යභාරය පලාත් සංවර්ධනයේ දී වැදගත්වන අයුරු විස්තර කරන්න.

(ලකුණු 15 යි)

08. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයෙහි වර්ධනය හා කලමනාකරණය කිරීම සඳහා හඳුන්වා දී ඇති භෞතික සැලසුම් පහත සඳහන් කාලයන් (Layer) යටතේ සාකච්ඡා කරන්න.

i. ජාතික මට්ටම (National)
ii. ප්‍රාදේශීය මට්ටම (Regional)
iii. නාගරික මට්ටම (Urban)

(ලකුණු 20 යි)

******************************